සැ. යු. - 2025.10.10 වැනි දින පළ කරන ලද අංක 2458 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,459 - 2025 ඔක්තෝබර් මස 17 වැනි සිකුරාදා - 2025.10.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1282 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1290 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 නොවැම්බර් 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## මාතලේ ප්‍රාදේශීය සභාව

### 1893 අංක 09 දරන ගෝ ඝාතක ආඥාපනත යටතේ විරෝධතා කැඳවීම

මාතලේ ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ ජූලි මස 03 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. කේ. එස්. බී. ජයරත්න,
සභාපති,
මාතලේ ප්‍රාදේශීය සභාව,
පලාපත්වල.

2025 සැප්තැම්බර් මස 20 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1893 අංක 09 දරන ගෝ ඝාතක ආඥා පනතේ 03 වන වගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂය සඳහා ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති අය වෙනුවෙන් බලපත්‍ර ලබා දීම පිළිබඳ විරෝධතා කැඳවනු ලබන අතර, ඒ සඳහා මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත් වන අයෙක් හෝ අයවලුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙනද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දා සිට දින 14 ක් ඇතුළත මාතලේ ප්‍රාදේශීය සභාව වෙත දන්වා එවිය යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ 7(2) වගන්තිය ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ගවමස් වෙළඳසැල පවත්වාගෙන යන ස්ථානය* | *මස් වර්ගය* |
|---|---|---|
| එස්. එච්. එම්. ෆලීල්,<br>අංක 38/4,<br>කෝට්ටේගොඩ, පලාපත්වල,<br>මාතලේ | අංක 38/4, කෝට්ටේගොඩ, පලාපත්වල, මාතලේ | ගවමස් |

10-153

---

## ගාල්ල මහා නගර සභාව

### මහා නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය යටතේ (252 අධිකාරය) කරනු ලබන දැන්වීම

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 04 දරන වීථි නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනතේ 03 වගන්තිය මගින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය ප්‍රකාරව (252 අධිකාරය) හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2(1) (අ) වගන්තිය ප්‍රකාරව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා ගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය ඉදිරියෙන් දක්වන පරිදි නම් කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආර්. එම්. ටී. කේ. රත්නායක,
නාගරික කොමසාරිස්,
ගාල්ල මහා නගර සභාව.

2025 ඔක්තෝබර් 03 වැනි දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *මාර්ගයේ ආරම්භය සහ අවසානය* | *මාර්ගය නම් කිරීම* |
|---|---|
| රිච්මන්ඩ් කන්ද දුම්රිය ගේට්ටුව අසලින් ආරම්භවන වක්වැල්ල පාර සිට එස්. එච්. දහනායක මාවත දක්වා මාර්ගය | "යූ. ජී. ඩී. ආරියතිලක මාවත" (කුඹල්වැල්ල II පටුමග) |

10-235

---

**හලාවත ප්‍රාදේශීය සභාව**

2026 කෙටුම්පත් අයවැය ලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2020.10.29 දින අංක 2199/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 10(2) ප්‍රකාරව, හලාවත ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය සඳහා සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය **2025.10.17 දින සිට 2025.10.28 දින දක්වා** රජයේ වැඩ කරන දිනයන්හිදී, කාර්යාල වේලාව තුළ හලාවත ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය හා යගම්පත්තුව උපකාර්යාලය, මාදම්පේ උපකාර්යාලය, මුන්නේශ්වරම උප කාර්යාලය, කාක්කපල්ලිය උප කාර්යාලය යන ස්ථානවලදී මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා අවස්ථාව සලසා දී ඇති බව මෙයින් දැනුම් දෙමි.

එම්. පී. අරුණ ශ්‍රී ආනන්ද,
සභාපති,
හලාවත ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 10 වන දින,
හලාවත ප්‍රාදේශීය සභාව,
මාදම්පේ.

10-222

---

**නාරම්මල ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා අයවැය සම්පාදන හා බලාත්මක කිරීමේ රීති මාලාවේ 10(2) වගන්තියට අදාළව බල ප්‍රදේශයේ පුරවැසියන් වෙත කෙරෙන නිවේදනයයි

2026 වර්ෂය සඳහා නාරම්මල ප්‍රාදේශීය සභාවේ කෙටුම්පත් කරන ලද අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා අවස්ථාව ලබා දෙන බව කාරුණිකව දන්වා සිටිමි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
නාරම්මල.

2025 ඔක්තෝබර් මස 08 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දීය.

දුරකථන අංකය : 037 2249275
ෆැක්ස් : 0372249681
විද්‍යුත් තැපැල : narammalaps@gmail.com

10-202

**රිදීගම ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා අයවැය සම්පාදන හා බලාත්මක කිරීමේ රීති මාලාවේ 10(2) වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශයේ මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

2026 වර්ෂයේ රිදීගම ප්‍රාදේශීය සභාවේ කෙටුම්පත් අයවැය ලේඛනය පහත සඳහන් ස්ථානවල දී පරීක්ෂා කර බැලීමට මහජනතාවට අවස්ථාව සලසා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය | - | රිදීගම |
| 02. | ප්‍රාදේශීය සභා උප කාර්යාලය | - | දොඩම්ගස්ලන්ද/හේවාවිස්ස |
| 03. | මහජන පුස්තකාලය | - | දොඩම්ගස්ලන්ද/රම්බඩගල්ල/හේවාවිස්ස/රිදීගම |

සභාපති,
රිදීගම ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 10 වැනි දින.

10-223

---

**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමඟ කියවිය යුතු, වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2020.10.29 දින අංක 2199/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (අති විශෙෂ) පළ කරන්නට කටයුතු කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 10(2) ප්‍රකාරව කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය සඳහා සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය **2025.10.10 දින සිට 2025.11.03 දින** දක්වා කරුවලගස්වැව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී, කාර්යාලීය වේලාව තුළ මහජනතාවට පරීක්ෂා කර බැලීමට ඉඩකඩ සලසා ඇති බව මෙයින් දැනුම් දෙමි.

එන්. එම්. නීල් නවරත්න,
සභාපති,
කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව.

දුරකථන අංකය : කාර්යාලීය - 0322267917

10-224

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා කෙටුම්පත් අයවැය ලේඛනය පරීක්ෂා කර බැලීම වෙනුවෙන් මහජනතාව වෙත කරනු ලබන දැනුම් දීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුගතව හා 2020 අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකරව 2026 වර්ෂයෙහි කෙටුම්පත් අයවැය ලේඛනය **2025.10.17 දින සිට 2025.10.27** දින දක්වා සතියේ වැඩ කරන දිනවල **පෙ. ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** බල ප්‍රදේශයේ මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා කාර්යාල පරිශ්‍රය සහ මහජන පුස්තකාල පරිශ්‍රයෙහි තබා ඇති බව මෙයින් දැනුම් දෙමි.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

10-225

**මීගමුව මහා නගර සභාව**

ගෝඝාතක ආඥාපතේ (272) වන අධිකාරිය යටතේ විරෝධතා කැඳවීම

මීගමුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස්, නුවනි සුදුසිංහ වන මම මහා නගර සභා ආඥාපනතේ 286(අ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂය සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයෙහි ගව මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කර ඇති බැවින්, එම බලපත්‍රය ලබා දීම පිණිස මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත් වන අයවළුන් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙනද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දා සිට, දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් නාගරික කොමසාරිස් නමට එවිය යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ (272) වන අධිකාරිය 7(2) වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

නුවනි සුදුසිංහ,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගමුව මහා නගර සභා කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ඉල්ලුම්කරුගේ නම | - | එම්. එච්. එම්. ෂිහාන් |
| මස් වෙළඳාම පවත්වාගෙන යාමට යෝජිත ස්ථානය | - | අංක 42, යොන් වීදිය, මීගමුව |
| වෙළඳාමේ ස්වභාවය | - | ගවමස් වෙළඳාම |

10-207

---

**වේලනයි ප්‍රාදේශීය සභාව**

වත්කම් සඳහා බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තිය යටතේ සහ 2019.07.12 දිනැති අංක 2137 දරන *ගැසට් පත්‍රය* මත වේලනයි නගර ප්‍රදේශය සඳහා සියලුම නේවාසික නිවාස, වාණිජ ගොඩනැගිලි, ඉඩම් සහ ස්ථාවර වත්කම් වේලන දකුණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යටතේ වාර්ෂික වත්කම් බදු තක්සේරුව 2025 වසර සඳහා වන වරිපනම් වටිනාකම 2026 වසර සඳහා වාර්ෂික වරිපනම් අගය ලෙස පිළිගෙන 2025 සිව්වන කාර්තුවේ සිට බදු අය කිරීමට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උපවගන්තිය යටතේ ලබා දී ඇති බලතල අනුව සහ වාර්ෂික වත්කම් තක්සේරුව අනුව වේලනයි බල ප්‍රදේශයට අයත් වේලනයි දකුණු ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකම ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂික වරිපනම් බදු වටිනාකම ලෙස 5% ක් නියම කර ඇත.

එසේම 2025 සිව්වන කාර්තුව සඳහා බද්ද 2025.01.10 සිට 2025.12.31 දක්වා කාලය තුළ ගෙවිය යුතු ය. තව ද නියමිත කාර්තුව සඳහා වරිපනම් බදු 2025.10.31 යන දින හෝ ඊට ප්‍රථම වේලනයි ප්‍රාදේශීය සභාවට ගෙවන්නේ නම් කාර්තුමය වරිපනම් වලින් 5% ක අඩු කිරීමක් ලබා දෙනු ලැබේ.

තව ද නියමිත දිනට බදු නොගෙවන හිස් ඉඩම් සහ නේවාසික දේපළ සඳහා 15% ක් ද හිස් බිම් සහ නේවාසික ඉඩම් හැර වෙනත් වත්කම් සඳහා 20% දඩයක් ද අය කෙරේ.

සිවලිංගම් අසෝක් කුමාර්
සභාපති,
වේලනයි ප්‍රාදේශීය සභාව,
වේලනයි.

10-205

**අලව්ව ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයේ අයවැය කෙටුම්පත

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය **2025 ඔක්තෝබර් මස 17 දින සිට 2025 ඔක්තෝබර් මස 24 දින** තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ අලව්ව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී මහජනතාවට පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීතිවල 10.2 (ආ) රීතිය ප්‍රකාරව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

පී. ජී. ඒ. පී. පරණගමගේ,
සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.

2025 ඔක්තෝබර් මස 17 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා කාර්යාලය,
අලව්ව.

10-253

---

**මාවතගම ප්‍රාදේශීය සභාව**

**2026 වර්ෂයේ අයවැය කෙටුම්පත**

මාවතගම ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත් ලේඛනය **2025 ඔක්තෝබර් මස 21 දින සිට 2025 ඔක්තෝබර් 29 වැනි දින තෙක්** (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී සහ මාවතගම මහජන පුස්තකාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති වල 10.2(ආ) රීතිය ප්‍රකාර මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී. තුෂාර විජේසේකර,
සභාපති,
මාවතගම ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 10 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලය,
මාවතගම.

10-210

---

**පොල්පිතිගම ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද අයවැය ලේඛනය

පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා වූ කෙටුම්පත් කරන ලද අයවැය ලේඛනය **2025.10.17 දින සිට 2025.10.28 දින දක්වා** (රජයේ නිවාඩු දින සහ ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීතිවල 10.2 (ආ) රීති ප්‍රකාරව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඊ. එම්. මහින්ද,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
පොල්පිතිගම.

2025 ඔක්තෝබර් මස 08 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලය,
පොල්පිතිගම.

10-166

**වේලනයි ප්‍රාදේශීය සභාව**

තක්සේරු වාර්තා ප්‍රදර්ශනය කිරීම සහ විරෝධය දැක්වීම

වේලනයි ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව තුළ වේලනයි ප්‍රදේශයට අයත් සියලුම නේවාසික, වානිජ ගොඩනැගිලි, ඉඩම් සහ නිවාස වල වාර්ෂික වටිනාකම ප්‍රාදේශීය සභා පනතේ අංක 134 සහ 141(3) යටතේ පැවරී ඇති බලතල අනුව සටහන් කර ඇත. 1987 අංක 15 දරන වරිපනම් ලේඛනය 2025.09.22 සිට 2025.10.21 දක්වා කාර්යාල දිනවල දී **පෙරවරු 8.30 සිට පස්වරු 4.00 දක්වා** වේලනයි ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ මහජන ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශනය කෙරෙන බව මෙයින් දන්වා සිටිමි.

එකී වත්කම්වල වාර්ෂික තක්සේරුව සම්බන්ධයෙන් යම් විරෝධතා ඇත්නම් ඉහත සඳහන් කාල සීමාව තුළ ලේකම්, සභාපති ප්‍රාදේශීය සභාව වේලනයි යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකි බව හෝ කාර්යාල දින වල දී **පෙ. ව. 8.30 සිට පස්වරු 4.00 දක්වා** සෘජුවම ඉදිරිපත් කළ හැකි බව ද දන්වා සිටිමි. නිශ්චිත කාල සීමාවෙන් පසුව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තව ද, දේශීය වත්කම්වල වරිපනම් ලේඛනයේ වාර්ෂික තක්සේරුවට අදාළ තොරතුරු බැලීමට අවසර ඇත්තේ ඉඩමේ හිමිකරුට හෝ නීත්‍යානුකූල හිමිකරුට පමණක් බවත්, වරිපනම් ලේඛනයට පැමිණෙන අයට තම අනන්‍යතාව තහවුරු කර ගැනීම අනිවාර්ය ලෙස සලකන බවත් විශේෂයෙන් සඳහන් කර ඇත.

සිවලිංගම් අශෝක්කුමාර්,
සභාපති,
වේලනෙයි ප්‍රාදේශීය සභාව,
වේලනෙයි.

10-206

---

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

ගෝඝාතකාගාර ආඥාපනත 7(2) විධිවිධාන යටතේ විරෝධතා කැඳවීම

මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි දැක්වෙන විස්තර සඳහන් ස්ථානයෙහි ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා 2026 වර්ෂයට බලපත්‍ර ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති බවට ගෝඝාතකාගාර ආඥාපනත 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍රය ලබා දීමට විරෝධතාවයක් පවතී නම් පාතහේවාහැට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පදිංචි ඕනෑම අයකුට විරෝධතා ඉදිරිපත් කළ හැකි ය. එම විරෝධතාවලට හේතු සහිතව පිටපත් 02 කින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් (දහහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙසට මෙයින් කාරුණිකව දන්වමි.

**උපලේඛනය**

| *නම හා ලිපිනය* | *වෙළඳ ස්ථානයේ ලිපිනය* | *වෙළඳාම් කරන මස් වර්ගය* |
|---|---|---|
| කේ. ආර්.හසන් මොහොමඩ්,<br>අංක 190, එනසල්ගොල්ල පාර,<br>තලාතුඔය | අංක 176, මුස්ලිම් ජනපදය.<br>දෙල්තොට | ගවමස් |

කේ. එස්. බී. රාජනායක,
ගරු සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 10 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-239

**බිබිල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා කෙටුම්පත් අයවැය ලේඛනය පරීක්ෂා කිරීම

බිබිල ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා අයවැය කෙටුම්පත මහජනතාවට පරීක්ෂා කිරීම සඳහා බිබිල ප්‍රාදේශීය සභා කාර්යාලයේ **2025.10.30 දින සිට 2025.11.10 දක්වා** තබා ඇති බව නිවේදනය කරමි.

වී. සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

10-151

---

**යටිනුවර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටිනුවර ප්‍රාදේශීය සභාව තුළ පිහිටියා වූ මංමාවත්/පාරවල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වූ පියවර අනුගමනය කිරීම සම්බන්ධයෙන් අවසර දී ඇති කාලයක් වශයෙන් 2025.07.18 දින සිට 2028.07.18 දක්වා කාලය සැලකීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අවසර ලබා දී ඇති හෙයින් ද, ඒ අනුව මෙම පහත උපලේඛනයේ විස්තර කරනු ලබන මංමාවත්/පාරවල් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු සභාව විසින් පවත්වාගෙන යනු ලබන මංමාවත්/පාරවල් වශයෙන් සැලකීම සඳහා 2025.02.24 දින පැවති කළමනාකරණ කමිටු තීරණ අංක 528 යටතේ යෝජනා සම්මත කර ඇති හෙයින් ඊට විරෝධතා ඇත්නම් ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීම සඳහා මෙයින් නිවේදනය කරමි.

නලීන් එරන්ද පිටියේකුඹුර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව,


2025 අගෝස්තු මස 31 වැනි දින,
පිළිමතලාව,
ඇඹිල්මීගම,
යටිනුවර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග* | *පළල* | *පිඹුරු පත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | කඩුගන්නාව පොත්තපිටිය මාර්ගයේ 7 කණුව අසලින් දිවෙන මාර්ගය | මාදිලිගම | කඩුගන්නාව පොත්තපිටිය මාර්ගයේ 7 කණුව අසලින් | කුඹුර අවසන් වන ස්ථානය | 1. එම්. ආර්. රත්න මැණිකේ මිය<br>2. එම්. ආර්. ප්‍රේමාවතී මිය<br>3. එම්. ආර්. ස්වර්ණතිලකා මිය | 1.ජී. ඩබ්. ජී. ටී. සේනාරත්න මයා | අඩි 175 | අඩි 10 | 10788 |

K.B.LANSAKARANAYAKE
REGD.LICENSED SURVEYOR
215, PILIMATHALAWA.

PLAN NO: 10788




REFERENCE
TP: TELEPHONE POST
ST: STAKE WOODEN

PLAN
OF
AN ALLOTMENT OF LAND CALLED
GANILADENIYE KUMBURA (PROPOSED ROAD)
SITUATED AT = ASWEDDUMA
G.S. = MADILIGAMA
In KANDUPALATHA KORALE OF YATINUWARA
A.G.A. = YATINUWARA
PRADESHIYA SABA = YATINUWARA
KANDY DISTRICT
CENTRAL PROVINCE

| CONTAINING IN EXTENT | | |
|---|---|---|
| LOT NO | A - R - P | (HECT:) |
| 1 | 0 - 0 - 09.72 | (0.0246) |

SURVEYED ON = 31.10.2024

K.B. LANSAKARANAYAKE (F.S.I.)
Registered Licensed Surveyor
(J: P. All Island)
215, Pilimatalawa

# විවිධ දැන්වීම්

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමඟ කියවිය යුතු 147 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින්, එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව ඇතුළත පහත දැක්වෙන බලපත්‍ර ගාස්තු නියම කිරීම හා අය කිරීම කරනු ලැබිය හැකිය. ඒ අනුව වාර්ෂික වටිනාකම මත පදනම් වූ බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට, මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී වෙළඳ බලපත්‍ර ගාස්තුව 2026 වර්ෂයේ මාර්තු මස 31 දින හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතු අතර, රජය මඟින් පනවා ඇති බදු මුදල් ද වෙළඳ බලපත්‍ර ගාස්තුවලට අමතරව ගෙවිය යුතු වේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ ද අවස්ථාවක, ඉහත 2 කොටසේ කුමක් සඳහන්ව තිබුණා ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පළෙ හි 2025 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු බවට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I තීරය* | *II තීරය* | | |
|---|---|---|---|---|
| | | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | *බලය දෙනු ලබන කාර්යයන්* | *රු. 750.0 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 750.0 ඉක්මවන එහෙත් රු. 1,500.0 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 1,500.0 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 1. | පළතුරු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | සිල්ලර වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | එළවළු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | සිල්ලර වෙළඳාම (තොග) | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | පාපැදි අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | මෝටර් රථ අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |

| *අනු. අංකය* | *I තීරය* | *II තීරය* | | |
|---|---|---|---|---|
| | | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | *බලය දෙනු ලබන කාර්යයන්* | *රු. 750.0 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 750.0 ඉක්මවන එහෙත් රු. 1,500.0 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 1,500.0 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 8. | ත්‍රී රෝද රථ අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ලී මෝලක් (අතින් ඉරන ලද ලී) | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | වඩු මඩුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | විදුලි කර්මාන්ත වැඩපළවල් (ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර) | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | අනුමත ආයතන තුළ සකස් කර පැකට් කරන ලද ශීත කළ කුකුල් මස් හා මාළු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | කරවල විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | බිත්තර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ග්‍රොසරි | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පුවක්, කරුංකා, ගම්මිරිස්, කෝපි මිලට ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කැබලි රෙදි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | හම්/රෙක්සින් භාණ්ඩ නිපදවීම (සපත්තු, බෑග් හා වෙනත්) | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ශබ්ද වාහිනී යන්ත්‍ර ක්‍රියාකරවීම හා කුළියට දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | බත් කඩ, ආපනශාලා සහ තේ කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කිරිපට්ටි හා කිරි වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ලොන්ඩරි | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | සංචාරක වෙළඳාම (වඩේ, වේස්, බයිට් වර්ග, බේකරි නිෂ්පාදන) | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | පොදු වෙළඳපළ | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | බාබර් සාප්පු | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | සුවඳ විලවුන් හෝ විෂබීජ නාශක විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | තීන්ත/වාර්නිෂ් වර්ග විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | නවාතැන් පහසුකම් සහිත ව්‍යාපාර | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පරිගණක මුද්‍රණ කටයුතු | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | හාල් තොග හා සිල්ලර | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ඔරලෝසු අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |

*සැ. යු.*- සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් ආපනශාලා සහ ලැගුම්හල් පෙර වර්ෂයේ ලැබීම් 1% බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු ය.

| අනු. අංකය | *I තීරය* | *II තීරය* | | |
|---|---|---|---|---|
| | | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | *බලය දෙනු ලබන කාර්යයන්* | *රු. 750.0 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 750.0 ඉක්මවන එහෙත් රු. 1,500.0 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 1,500.0 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| **අප්‍රසන්න ව්‍යාපාර :** | | | | |
| 36. | කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ඇසිඩ් වර්ග නිෂ්පාදනය හා වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ෆයිබර් ග්ලාස් නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | සත්ත්ව පාලනය (කිරි හා මස් සඳහා) | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | සත්ත්ව ආහාර නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | ගෘහ භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | වේවැල් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ඉටිපන්දම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ගඩොල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති, බ්ලොක්ගල් නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | පැළ තවානක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| **අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :** | | | | |
| 1. | පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | සිප්පි ඇඹරුම්හලක් හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | තැඹිලි, කුරුම්බා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | හුණු ගල් පිළිස්සීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | කළුගල් වැඩපළක් | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | රූපලාවන්‍යාගාර | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | වායු සමකරණ යන්ත්‍ර, ශීතකරණ, අධිශීතකරණ යන්ත්‍ර අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | බිම්මල් වගාව හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I තීරය | II තීරය | | |
|---|---|---|---|---|
| | බලය දෙනු ලබන කාර්යයන් | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750.0 නොඉක්මවන අවස්ථාවක<br>රු. ශත | රු. 750.0 ඉක්මවන එහෙත් රු. 1,500.0 නොඉක්මවන අවස්ථාවක<br>රු. ශත | රු. 1,500.0 ඉක්මවන අවස්ථාවක<br>රු. ශත |
| **අන්තරාදායක ව්‍යාපාර :** | | | | |
| 1. | වෑල්ඩින් වැඩපළ (ඔක්සි ඇසිඩ් භාවිතය) | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | වෑල්ඩින් වැඩපළ (විදුලි භාවිතය) | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | වීදුරු තහඩු කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | ඡායා පිටපත් ගැනීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | කුෂන් වැඩපළ | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | හඳුන්කූරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ගෑස් අලෙවිය/අළෙවි නියෝජිත | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ස්වර්ණාභරණ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ගිනිකෙළි, රතිඤ්ඤා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | වීදුරු භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ග්‍රිල් ගේට්ටු සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ටින්කර් වැඩ | 500 0 | 750 0 | 1,000 0 |

10-214/1

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) උපවගන්තිය යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ කර්මාන්ත බදු 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට, මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී කර්මාන්ත බදු ගාස්තු 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 දින හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතු අතර, රජය මගින් පනවා ඇති බදු මුදල් ද වෙළඳ බලපත්‍ර ගාස්තුවලට අමතරව ගෙවිය යුතුය.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II තීරුවේ, එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I තීරය* | *II තීරය පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 1. | ගඩොල්/සිමෙන්ති ගඩොල්, බීරලු, මල් පෝච්චි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | අයිස්ක්‍රීම්/බීම පැකට් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | කිරි ආශ්‍රිත නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | මැටි භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | පාවහන් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | පැණි/හකුරු නිෂ්පාදනය හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | අත් යන්ත්‍ර මගින් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ඉදල්/කොසු/පාපිසි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | හඳුන්කූරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | බෑග් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ඇඳුම් මැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ඩිජිටල් තාක්ෂණ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | බීරළු ලී කැටයම් වැඩපළක් | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පොල්තෙල් මෝලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ස්වර්ණාභරණ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ඡායාරූප ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | හුණු හා ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | බලවේග තේ කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | වී මෝල් | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ත්‍රී රෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *අනු. අංකය* | *I තීරය* | *II තීරය පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 23. | යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | පාපැදි, යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | දේශීය බෙහෙත් වර්ග නිෂ්පාදිත ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | මෝටර් රථ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | ගල් වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | යන්ත්‍රානුසාරයෙන් කැටගල් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | වෙල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ගෘහ භාණ්ඩ විසිතුරු භාණ්ඩ ආදී නිෂ්පාදන | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | කුඩ, වට්ටි වැනි වේවැල් බට ආශ්‍රිත නිෂ්පාදන | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ඉලෙක්ට්‍රික් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ගරාජ් | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ලී මෝලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | වායුසමීකරණ ශීතකරණ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | බෑග් මැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | රස කැවිලි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | වැලි ගොඩ දැමීම හෝ වැලි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I තීරය | II තීරය පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | කර්මාන්තය | රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 48. | රූපලාවන්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | වීදුරු කැපීම හා පින්තූරු රාමු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | වැල්ඩිං වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | බිම්මල් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52 | ඉඩම් වෙන්දේසි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | ඔරලෝසු අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ඉටිපන්දම් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | වාහන පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | වාහන පිරිපහදු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | පහන් තිර නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | වාහන ටෙන්ට් ගැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | වාහන කර්ටන් ගැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | පුළුන් ආශ්‍රිත නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |

10-214/2

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උපවගන්තිය යටතේ හෝ 150 වගන්තිය යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන වෙළඳ බලපත්‍ර ගාස්තුවකට හෝ කර්මාන්ත බද්දකට යටත් නොවූ ව්‍යාපාර හා කර්මාන්ත ස්වභාවයන් සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට, මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී ව්‍යාපාර බදු ගාස්තු 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතු අතර, රජය මගින් පනවා ඇති බදු මුදල් ද බලපත්‍ර ගාස්තුවලට අමතරව ගෙවිය යුතු වේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මීගහකිවුල ප්‍රාදේශීය සභා

බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

I වන කොටස

**ව්‍යාපාර :**

1. සිල්ලර වෙළඳසැලක් පැවැත්වීම
2. රෙදිපිළි හෝ නිමි ඇඳුම් අලෙවිසැලක් පැවැත්වීම
3. සාප්පු බඩු අලෙවිසැලක් පැවැත්වීම
4. පාවහන් අලෙවිසැලක් පැවැත්වීම
5. සන්නිවේදන මධ්‍යස්ථානයක් පැවැත්වීම
6. වර්ණ රසායනාගාරයක් පැවැත්වීම
7. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
8. තීන්ත, සායම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
9. පෞද්ගලික අධ්‍යාපන ආයතයනයක් පැවැත්වීම
10. පෙරපාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පැවැත්වීම
11. පරිගණක පුහුණු පාඨමාලාවක් පැවැත්වීම
12. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පැවැත්වීම
13. රියදුරු පුහුණුව සපයන ආයතනයක් පැවැත්වීම
14. සමුපකාර සමිති සිල්ලර කඩ (ප්‍රාදේශික) පැවැත්වීම
15. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
16. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
17. මූල්‍ය ආයතනයක් පැවැත්වීම
18. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
19. ලීසිං සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
20. පෞද්ගලික රෝහලක් පැවැත්වීම
21. ස්වර්ණාභරණ විකිණීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම
22. පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
23. ලී බඩු විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
24. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පැවැත්වීම
25. උත්සව භාණ්ඩ කුළියට දීම
26. ඇස් කණ්නාඩි සාප්පුවක් පැවැත්වීම
27. ලොතරැයි නියෝජිත ආයතනයක් පැවැත්වීම
28. පිහන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම
29. රේස් බුකියක් පැවැත්වීම
30. පින්තූර රාමු කිරීම හා වීදුරු කැපීමේ ස්ථානයක් පැවැත්වීම
31. වී මිල දී ගැනීමේ ස්ථානයක් පැවැත්වීම
32. සන්නිවේදන සේවා සැපයීමේ ආයතනයක් පැවැත්වීම
33. ජංගම දුරකථන අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
34. රැකියා නියෝජිත ආයතනයක් පැවැත්වීම
35. වීඩියෝ පට, සංයුක්ත තැටි විකිණීම හෝ කුළියට දීමේ ස්ථානයක් පැවැත්වීම
36. ලිපිද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පැවැත්වීම
37. ලී බඩු වෙළඳසැලක් පැවැත්වීම
38. පුවත්පත් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
39. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම

40. ගබඩාවක් ලෙස කුළියට දෙන ස්ථානයක් පැවැත්වීම
41. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
42. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
43. සිමෙන්ති විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
44. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
45. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
46. යතුරු පැදි, ත්‍රීරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
47. බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
48. සුපිරි වෙළඳසැලක් (ෆුඩ් සිටියක්) පවත්වාගෙන යාම
49. සත්ත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ නියෝජිත ආයතනයක් පැවැත්වීම
51. භාවිතා කරන ලද වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. භාවිතා කරන ලද මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
53. වෛද්‍යවරුන් හා රෝගීන් මුණගස්වන ආයතනයක් (චැනල් සෙන්ටර්) පවත්වාගෙන යාම
54. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
57. බලයලත් අරක්කු හා රට බීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. බටහිර ඖෂධ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම (ෆාමසි)
59. කුළුබඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
62. ජංගම වෙළඳ වාහනයක් හෝ ජංගම වෙළඳසැලක් පවත්වාගෙන යාම
63. තේ කම්හලක් පැවැත්වීම
64. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. පරණ ලෝහ එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. එළවළු පළතුරු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
67. තොග වශයෙන් භාණ්ඩ ගබඩා කර විකිණීම (ගල්, වැලි, ගඩොල්, සිමෙන්ති, පොහොර....)

## II කොටස

## 2025 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම

| | *I තීරුව* | *II තීරුව<br>රු. ශත* |
|---|---|---|
| i. | රු. 6,000 නොඉක්මවන විට | අයකිරීමක් නැත |
| ii. | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90.00 |
| iii. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180.00 |
| iv. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360.00 |
| v. | රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන විට | 1,200.00 |
| vi. | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000.00 |

10-214/3

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා වාහන හා සතුන් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාහන හා සතුන් පිළිබඳ බද්දක්, ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර ගාස්තුවක්, අමාත්‍යවරයා විසින් අනුමත කොට පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් ස්ථිර කරන ලද වෙනත් යම් ආකාරයක බද්දක්, හතර වන උපලේඛනයේ සඳහන් වුවද සාමාන්‍යයෙන් එම ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සියලු වාහන සහ සතුන් වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් වූ අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2026 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳව බද්දක් 2026 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අය කිරීමට පනතේ 147 වගන්තිය ප්‍රකාරව 148 (3) වැනි වගන්තිය යටතේ 2026 මාර්තු 31 දිනට පෙර අයකිරීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I තීරුව* | *II තීරුව රු. ශත* |
|---|---|---|
| | *වාහන හා සත්ත්ව බද්ද* | |
| 01. | මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක්, මෝටර් ලොරියක්, රික්ෂෝවක්, කරත්තයක්, බයිසිකලයක් හෝ බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |
| 02. | සෑම බයිසිකලයක් හෝ කරත්තයක් සඳහා : | |
| (අ) | වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) | වෙළඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් පාපැදි බලපත්‍ර ලියාපදිංචි | 04 0 |
| 03. | සෑම කරත්තයක් සඳහාම | 20 0 |
| 04. | සෑම අත්ට්‍රැක්ටරයක් සඳහාම | 10 0 |
| 05. | සෑම රික්ෂෝවක් සඳහාම | 7 50 |
| 06. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ එළුවෙකු සඳහාම | 15 0 |
| 07. | සෑම ඇතෙකු සඳහාම | 50 0 |

10-214/4

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසර සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) කොටසේ පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීථියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් උපලේඛනය සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂය සඳහා අයකළ යුතු බව මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී බලපත්‍ර ගාස්තුව 2026 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (අ) හා 122-126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල පරිදි සහ 1988.08.23 වැනි දින අංක 520/07 දරන IV (අ) කොටස පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන ඡේදය යටතේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් හෝ ඉදිකිරීමක ප්‍රදර්ශනය යම් වීදියකට/පාරකට/ඇළකට/වැවකට/කුඹුරකට හෝ ඉඩමකට මුහුණ ලා තිබේනම් උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2026.01.01 වැනි දින සිට අයකර ගැනීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| *අනු. අංකය* | *විස්තරය* | *මසක් හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 1. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 45 0 |
| 2. | බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ආධාරයක් මගින් ප්‍රදර්ශනය කරවා ඇති ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට ම | 125 0 |
| 3. | සෑම වර්ගයක ම ප්‍රචාරක බැනරයක් සඳහා සෑම වර්ග අඩියකට ම | 50 0 |
| 4. | චිත්‍රපට දර්ශන ප්‍රචාරය සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට ම | 20 0 |
| 5. | තාවකාලික ප්‍රදර්ශන පුවරු (කටවුට්) සඳහා සෑම වර්ග අඩියකට ම | 40 0 |
| 6. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා ලිත් වර්ෂයකට වර්ග අඩියකට අයකරනු ලබන මුදල | 200 0 |

10-214/5

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

විනෝද බදු පැනවීම

1984 අංක 27 දරන විනෝද බදු සංශෝධිත පනතින් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වගන්තියේ (1) උප වගන්තියට අනුව 2025 වර්ෂයේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන විනෝද බද්දට යටත් යම් කාර්යයකට ඇතුළත්වීම සඳහා අය කරනු ලබන ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අයකර ගැනීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1984 අංක 27 දරන විනෝද බදු සංශෝධිත පනතින් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වගන්තියේ (1) වන උපවගන්තියෙන් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව, මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වනු ලබන විනෝද බද්දට යටත් යම් කාර්යයකට ඇතුළත්වීම සඳහා අයකරනු ලබන ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අයකර ගැනීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

තව ද, ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ (176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර පැනවෙන බලපත්‍ර ගාස්තුව පහත පරිදි අයකිරීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 01. | දින 01 කට හෝ දින 07 නොඉක්මවන විට | 250 0 |
| 02. | දින 07 ඉක්මවන විට ඉන් වැඩි වන සෑම දිනකටම හෝ කොටසකටම | 50 0 |
| 03. | ජංගම විනෝද කටයුතු සඳහා | 1,500 0 |

10-214/6

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

1975/77 දරන සමාජ ශාලා ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ ගාස්තු පැනවීම

1975/77 දරන සමාජ ශාලා ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ ගාස්තු පනවා අය කර ගැනීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ ගාස්තු පනවා අයකර ගැනීමට පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1975/77 දරන සමාජශාලා ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ 2026 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගාස්තු පනවා අය කිරීම පහත උපලේඛනයෙහි සඳහන් පරිදි සිදුකළ යුතු බව මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 1. | ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 50 0 |
| 2. | වාර්ෂික බලපත්‍ර ගාස්තුව | 100 0 |

10-214/7

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.
.

2026 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබිය යුතු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2026 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු වශයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, ඒ එක් එක් කාර්තුවට අදාළ අක්කර බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%)ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද, ඉහත කී පනතේ 135 වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2026 වර්ෂය සඳහා රුපියල් 10.00 බැගින් වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වගන්තියේ (3) උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) කොටසේ 1989 පෙබරවාරි මස 03 (අ) දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් පහකට අඩු වූ නමුත් හෙක්ටයාර් 01ට නොඅඩු වන සෑම ඉඩමක් මත 2026 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින්වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

(ඇ) එකී පනතේ 134 (07) වගන්තිය ප්‍රකාර පහත සඳහන් පරිදි බදු මුදල් ගෙවනු ලබන ආකාරය අනුව වට්ටම් ප්‍රදානය කරනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

මුළු වර්ෂයේ ම බදු මුදල ජනවාරි මස 31 දින ඉකුත්වීමට මත්තෙන් ගෙවන්නේ නම් නියමිත බදු මුදලින් 10%ක වට්ටමක් ලබා දෙනු ලබන බවටත්,

බදු මුදල කාර්තු වශයෙන් ගෙවනු ලබන අවස්ථාවක දී බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවැනි මාසය තුළ ගෙවන්නේ නම් 5% ක වට්ටමක් ලබා දිය යුතු බව මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-214/8

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා කසල එක්රැස් කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987/අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 2012.10.05 දින අංක 1778/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) කොටසේ පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පලකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රාදේශීය සභා කොටසේ ඝණ අප ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කසල එක්රැස් කිරීම වෙනුවෙන් උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2026 වර්ෂය සඳහා අයකළ යුතු බව මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(අ) හා 122-126 වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2012.10.05 දින අංක 1778/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) කොටසේ පළාත් පාලන අති විශේෂ *ගැසට් පත්‍රයේ* ඌව පළාත් ගරු ප්‍රධාන ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රාදේශීය සභා කොටසේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කසල එක්රැස් කිරීම වෙනුවෙන් උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2026 වර්ෂය සඳහා අයකර ගැනීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 01. | කරමැටිය මැලිබන් ඇහලුම් කර්මාන්ත ශාලාවේ කසළ ඉවත් කිරීම සඳහා ට්‍රැක්ටර රථය ලබා ගැනීමේ එක් අවස්ථාවක් සඳහා | 10,000 0 |
| | විකල්ප අවස්ථාවකදී ටිපර් රථය සේවයේ යොදවන එක් අවස්ථාවක් සඳහා | 15,000 0 |
| 02. | කරමැටිය ප්‍රීමා පිටි කම්හලෙන් බැහැර කරන කසළ 1Kg - 40 Kg දක්වා | 1,500 0 |

* වැඩිවන සෑම 1 Kg සඳහා පෙර වටිනාකම අනුපාතික වටිනාකමක් වශයෙන් ගාස්තු අය කරේ. (1500/40)

10-214/9

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට ජල ගාස්තු අය කිරීම

මීගහකිවුල ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන ජල ව්‍යාපෘති මගින් ජලය ලබා ගන්නා පාරිභෝගිකයන් වෙතින් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් 2026 වර්ෂය සඳහා අය කිරීමට, මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත ව්‍යවස්ථා පනතේ අංක 02 යටතේ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා විසින් සාදනු ලැබ 1988.08.23 දිනැති අංක 520/07 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද වූ පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 34 දරන කාණ්ඩය වන ජල සම්පාදන පනතේ වූ අංක 40 සිට අංක 43 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල සඳහන් පරිදි පහත සඳහන් උපලේඛන වල සඳහන් අයුරින් හා අනෙකුත් ජල අයකිරීම් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල සම්පාදන ක්‍රමවලින් 2026.01.01 දින සිට ජල ගාස්තු අයකරගැනීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය..

**උපලේඛන අංක 01 - ගාස්තු අය කිරීම**

**මීගහකිවුල හා හෙලමල්වත්ත ජල යෝජනා ක්‍රමය**

| *අනු. අංකය* | *ගාස්තු ඒකක (ඝන මීටර්)* | *ගෘහ සම්බන්ධතා හා රජයේ ආයතන සඳහා* | | *ව්‍යාපාරික සහ අනෙකුත් ආයතන සඳහා* | |
|---|---|---|---|---|---|
| | | *ස්ථාවර ගාස්තු රු. ශත* | *ඒකකයකට රුපියල් රු. ශත* | *ස්ථාවර ගාස්තු රු. ශත* | *ඒකකයකට රුපියල්* |
| 01 | 0-05 දක්වා | 250 0 | 19 0 | 350 0 | 20 0 |
| 02 | 06-10 දක්වා | 300 0 | 19 0 | 400 0 | 20 0 |
| 03 | 11-15 දක්වා | 350 0 | 24 0 | 450 0 | 25 0 |
| 04 | 16-20 දක්වා | 400 0 | 29 0 | 500 0 | 30 0 |
| 05 | 21-25 දක්වා | 425 0 | 34 0 | 525 0 | 35 0 |
| 06 | 26-30 දක්වා | 450 0 | 39 0 | 550 0 | 40 0 |
| 07 | 31- 35 දක්වා | 475 0 | 44 0 | 575 0 | 45 0 |
| 08 | 36 හෝ 36න් ඉහළට | 500 0 | 49 0 | 600 0 | 50 0 |

**උපලේඛන අංක 02 - ගාස්තු අය කිරීම**

**10 කණුව, තල්දෙන ජල යෝජනා ක්‍රමය**

| අනු. අංකය | ගාස්තු ඒකක (ඝන මීටර්) | ගෘහ සම්බන්ධතා හා රජයේ ආයතන සඳහා | | ව්‍යාපාරික සහ අනෙකුත් ආයතන සඳහා | |
|---|---|---|---|---|---|
| | | ස්ථාවර ගාස්තු රු. ශත | ඒකකයකට රුපියල් රු. ශත | ස්ථාවර ගාස්තු රු. ශත | ඒකකයකට රුපියල් |
| 01 | 0-10 දක්වා | 175 0 | 15 0 | 300 0 | 19 0 |
| 02 | 11-15 දක්වා | 225 0 | 20 0 | 300 0 | 24 0 |
| 03 | 16-20 දක්වා | 225 0 | 25 0 | 350 0 | 29 0 |
| 04 | 21-25 දක්වා | 250 0 | 30 0 | 350 0 | 34 0 |
| 05 | 26-30 දක්වා | 250 0 | 35 0 | 350 0 | 39 0 |
| 06 | 31-35 දක්වා | 250 0 | 40 0 | 350 0 | 44 0 |
| 07 | 36 හෝ 36න් ඉහළට | 250 0 | 45 0 | 350 0 | 49 0 |

**උපලේඛනය අංක 03 - ගාස්තු අය කිරීම**

**වෙලන්ලන්ද/කෙසෙල්වත්ත/කෝමාරික /ලිහිණියාකැටිය/තල්දෙන අරුකුඹුර ජල යෝජනා ක්‍රමය**

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | 0-10 දක්වා | 175 0 | 15 0 | 300 0 | 20 0 |
| 02 | 11-15 දක්වා | 225 0 | 20 0 | 300 0 | 25 0 |
| 03 | 16-20 දක්වා | 225 0 | 25 0 | 350 0 | 30 0 |
| 04 | 21-25 දක්වා | 250 0 | 30 0 | 350 0 | 35 0 |
| 05 | 26-30 දක්වා | 250 0 | 35 0 | 350 0 | 40 0 |
| 06 | 31-35 දක්වා | 250 0 | 40 0 | 350 0 | 45 0 |
| 07 | 36 හෝ 36න් ඉහළට | 250 0 | 45 0 | 350 0 | 50 0 |

**ජල සේවා සඳහා ගාස්තු අයකිරීම් :**

| අනු. අංකය | විස්තරය | රු. ශත |
|---|---|---|
| 01. | ජල අයදුම්පතක් සඳහා ගාස්තු | 250.00 |
| 02. | ජල මීටරය සඳහා ගාස්තු | 7,500 0 |
| 03. | නව ජල සම්බන්ධතාවය ලබා ගැනීමේ දී තැන්පත් ගාස්තු | 5,000 0 |
| 04. | ජල බදු ලේඛනයේ නම සංශෝධනය කිරීමේ අයදුම්පත් ගාස්තු | 300 0 |
| 05. | ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කර ඇති එක් අවස්ථාවක ගාස්තු අයකිරීම | 5,000 0 |

**නව ජල සම්බන්ධතාවක් ලබාගැනීම සඳහා අයකරනු ලබන ගාස්තු :**

රු. ශත

| | | |
|---|---|---|
| 01. | ගෘහස්ථ හා රාජ්‍ය ආයතන | 10,000.00 |
| 02. | ව්‍යාපාර | 12,000.00 |

**සැලකිය යුතුයි :**

- නව ජල සම්බන්ධතාව ලබාගැනීමේ දී ප්‍රධාන නලයේ සිට සේවා සපයන නලය ලබාදීමට අවශ්‍ය සම්බන්ධතා උපාංගය, PVC අඟල් 1/2 එක් නලයක් (දිග 4m) සම්බන්ධතා ගාස්තුවට අදාළ වේ.

- ජල මීටරය ප්‍රාදේශීය සභාව තුළින්ම ලබා ගත යුතු ය.

- නව ජල සම්බන්ධතාව ලබාගැනීමේ දී ප්‍රධාන නලයට සම්බන්ධිත දිග 4m වන PVC නලයේ සිට සේවා සපයන නලය ලබා දීමට අවශ්‍ය සම්බන්ධතා නල සහ උපාංග (මීටරය රහිතව), ජල මීටර් කණුව ද පාරිභෝගිකයා විසින් සපයා ගත යුතුය. එසේ නොවේ නම් සභාව විසින් ඉදිරිපත් කරන ඇස්තමේන්තු ගත මුදල පාරිභෝගිකයා විසින් ගෙවිය යුතු ය.

**විසන්ධි කර ඇති ජල සම්බන්ධතා නැවත ලබාදීමේ ගාස්තු :**

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 01. | නිවාස/රජයේ ආයතන | 3,000.00 |
| 02. | වෙනත් (ව්‍යාපාර) | 5,000.00 |

**මාර්ග පළුදු කිරීමේ ගාස්තු :**

| | *රු. ශත* |
|---|---|
| ➢ කොන්ක්‍රීට් මාර්ගය පලුදු කිරීමේ දික් මීටර් 01 ක් සඳහා | 1,500 0 |
| ➢ තාර පාරක් පලුදු කිරීමේ දික් මීටර් 01 ක් සඳහා | 2,000 0 |
| ➢ කාපට් පාරක් පලුදු කිරීමේ දික් මීටර් 01 ක් සඳහා | 8,000 0 |

**පිරිපහදු කළ ජලය සඳහා ගාස්තු අය කිරීම:**

| | *රු. ශත* |
|---|---|
| * පිරිපහදු කළ ජලය ලීටර් 01ක් සඳහා | 4.00 |

10-214/10

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර, 1988.08.23 දින අංක 520/07 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථාවේ හා නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව, පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් 2026 වර්ෂය සඳහා අය කිරීමට, මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 දින අංක 520/07 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාවේ හා නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අයකිරීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

01. මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය හා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම

ඉදිකිරීම් සම්බන්ධ :

| | රු. ශත |
|---|---|
| 1. අයදුම්පත් ගාස්තුව | 300.00 |
| 2. පෙරසැරි ගාස්තුව : | |
| ➢ නේවාසික ගොඩනැගිලි | 2,500 0 |
| ➢ වාණිජ හා වෙනත් ගොඩනැගිලි : | |
| • කුඩා පරිමාණ | 5,500 0 |
| • මධ්‍ය පරිමාණ | 6,500 0 |
| • මහා පරිමාණ | 8,000 0 |
| 3. මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදි කිරීම | 1,500 00 |
| 4. දුරකථන විදුලි සංදේශ කුළුණු | 10,000 00 |

02. ගොඩනැගිලි ඉදිකිරීම/කොටසක් එකතු කිරීම/ගෙබිමේ විශාලත්වය පදිංචිය සඳහා වාණිජ හෝ වෙනත් නැවත ඉදිකිරීමක් සඳහා සංවර්ධන බලපත්‍ර වර්ග මීටර්වලින් භාවිත නිකුත්කිරීම

| *ගෙබිමේ විශාලත්වය වර්ග මීටර් වලින්* | *පදිංචිය සඳහා රු. ශත* | *වාණිජ හෝ වෙනත් භාවිත රු. ශත* |
|---|---|---|
| 45ට අඩු | 600 0 | 2,000 0 |
| 45-90 දක්වා | 1,600 0 | 2,500 0 |
| 91-180 දක්වා | 2,600 0 | 3,500 0 |
| 181-270 දක්වා | 3,600 0 | 4,500 0 |
| 271-450 දක්වා | 4,600 0 | 6,500 0 |
| 451-675 දක්වා | 5,600 0 | 8,500 0 |
| 676-900 දක්වා | 6,600 0 | 10,500 0 |
| 901-1,225 දක්වා | 7,600 0 | 12,500 0 |

වර්ග මීටර් 1226 සිට ඉහළට ව. මී 90 ක් වන එක් එක් අමතර ගෙබිම් ප්‍රමාණය පදිංචිය සඳහා (නේවාසික) රු. 1,000.00 බැගින් ද, ව. මී. 90 ක් වන ගෙබිම් ප්‍රමාණය වාණිජ හෝ වෙනත් සඳහා රු. 1,500.00 බැගින් ද ව. මී. 90 ට වඩා අඩුවන අවස්ථාවකදී අනුපාතික වශයෙන් ගාස්තු අය කෙරේ. (1,000/90, 1500/90)

➢ මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම :

| *මායිම් තාප්පය ඉදිකිරීමේ සීමාව* | *මායිම් තාප්පයේ දිග මීටර් එකක් සඳහා ගාස්තුව* | |
|---|---|---|
| | *නේවාසික<br>රු. ශත* | *වාණිජ හා වෙනත් වර්ග<br>රු. ශත* |
| ගොඩනැගිලි සීමාව පිටත | 40 0 | 50 0 |
| ගොඩනැගිලි සීමාව ඇතුළත | 60 0 | 70 0 |

| ➢ දුරකථන විදුලි සංදේශ කුළුණු | *පෙරසැරි ගාස්තු* | *රු. ශත.* |
|---|---|---|
| | උස මීටර් 0-20 දක්වා | 300,000 0 |
| | උස මීටර් 20-50 දක්වා | 400,000 0 |
| | උස මීටර් 50ට වැඩි | 600,000 0 |
| | ආවරණ අනුමැතිය සඳහා ගාස්තු | |
| | උස සෑම මීටර් 5කට | 20,000 0 බැගින් |

සංවර්ධන බලපත්‍ර අලුත් කිරීම - වර්ෂයකින් කාලය දීර්ඝ කිරීම - රු. 1,000 00
(සංවර්ධන බලපත්‍රය වර්ෂයක් පාසා දීර්ඝ කළ යුතු ය.)

03. නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ඉදිකිරීම /කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම සඳහා ආවරණ අනුමැතිය දීමේ ගාස්තු/මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම හා දුරකථන විදුලි සංදේශන කුළුණු සඳහා ගාස්තු :

| | | *නේවාසික<br>වර්ග මීටර් 1ක් සඳහා<br>ගාස්තුව<br>රු. ශත* | *වාණිජ හා වෙනත්<br>වර්ග මීටර් 1ක් සඳහා<br>ගාස්තුව<br>රු. ශත* |
|---|---|---|---|
| 1. | අත්තිවාරම් වැඩ පමණක්<br>(කයිරු මට්ටම් සම්පූර්ණ කොට ඇති විට) | 200 0 | 750 0 |
| 2. | වහල මට්ටම දක්වා (වහලය රහිතව ඉදිකොට ඇති විට) | 300 0 | 1,000 0 |
| 3. | සම්පූර්ණයෙන් ඉදිකොට ඇතිවිට | 500 0 | 1,250 0 |
| 4. | මායිම් තාප්ප දිග මී. 1ක් සඳහා | 30 0 | 60 0 |

5. දුරකථන, විදුලි සංදේශන කුළුණු (මීටර් වලින්) :

| | රු. ශත |
|---|---|
| ➢ 0-30 අතර | 200,000 0 |
| ➢ 30-60 අතර | 300,000 0 |
| ➢ 60ට වැඩි | 500,000 0 |

04. අනුකූලතා සහතිකය ලබා ගැනීම සඳහා :

| සංවර්ධන කාර්යයේ ස්වභාවය | අයකළ යුතු ගාස්තු (බදු රහිත) | | | |
|---|---|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම | ගෙබිම් ප්‍රමාණය (ව. මී.) | නේවාසික - තනි පුද්ගල | නේවාසික - මහල් නිවාස | නේවාසික නොවන |
| | ව. මී. 400 දක්වා | රු. 3,000.00 | රු. 4,000.00 | රු. 4,000.00 |
| | ව. මී. 400 ට වැඩි | රු. 3,000/- + ව. මී. 400 ට වැඩිවන සෑම ව. මී. 1ට හෝ ඉන් කොටසක් සඳහා රු. 10 බැගින් | රු. 4,000/- + ව. මී. 400 ට වැඩිවන සෑම ව. මී. 1ට හෝ ඉන් කොටසක් සඳහා රු. 15 බැගින් | රු. 4,000/- + ව. මී. 400 ට වැඩිවන සෑම ව. මී. 1ට හෝ ඉන් කොටසක් සඳහා රු. 25 බැගින් |

අයදුම්පතක් සඳහා 150.00

05. පිඹුරුපත අනුමත කිරීමේ : *රු. ශත*

අයදුම්පතක් සඳහා 200 0

පිඹුරුපත අනුමත කිරීමේ ගාස්තු :

| | | |
|---|---|---|
| පර්චස් 0-40 දක්වා ඉඩම් සඳහා | 3,000 0 | |
| පර්චස් 41 - 160 දක්වා | 5,500 0 | |
| පර්චස් 161 - 400 දක්වා | 10,500 0 | බැගින් |
| පර්චස් 401 සිට වැඩි සෑම පර්චස් 1 ක් සඳහා | 30 0 | බැගින් |

| 06. | ඉඩම් අනුබෙදුම් කට්ටියක් අනුමත කිරීම සඳහා ගාස්තු : | | *රු. ශත* |
|---|---|---|---|
| | අයදුම්පත් ගාස්තුව | | 200 0 |
| | සංවර්ධන කාර්යයේ ස්වභාවය | | අයකළ යුතු ගාස්තු රු. ශත |
| | (i) ඉඩම් අනු කොටස්වලට බෙදීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම | බිම් කට්ටියක ප්‍රමාණය | එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර) |
| | (ii) ආවරණ අනුමැතිය සඳහා | ව. මී. 150-300 අතර<br>ව. මී. 301-600 අතර<br>ව. මී. 601-900 අතර<br>ව. මී. 901ට වැඩි<br>එක් බිම් කොටසකට | 600 0<br>500 0<br>400 0<br>300 0<br>850 0 |
| 07. | වීථිරේඛා සහතිකය සඳහා<br>අයදුම්පතක් සඳහා | | 3,000 0<br>150 0 |

| | | |
|---|---|---|
| 08. | නොපවරා ගැනීමේ සහතිකය සඳහා | 1,500 0 |
| | අයදුම්පතක් සඳහා : | 150 0 |
| 1 | ඉඩම්/කුඹුරු ගොඩකිරීම සඳහා : | |
| | ව. මී. 150 ට අඩු ඉඩම් සඳහා | 2,600 0 |
| | ව. මී. 151-300 දක්වා | 5,100 0 |
| | ව. මී. 301ට වැඩි වන සෑම ව. මී. 150 කටම | 3,100 0 |
| | ආවරණ අනුමැතිය සඳහා ගාස්තු : | |
| | සෑම වර්ග මීටරයකටම | 5,500 0 බැගින් |

10-214/11

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීම

මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හා කර්මාන්ත සඳහා පාරිසරික බලපත්‍රය ලබා ගැනීමට අදාළව පහත යෝජනාවේ පරිදි 2026 වර්ෂය සඳහා ගාස්තු අයකිරීමට, මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වගන්තිය යටතේ සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1553/16 දරන වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 25 දිනැති *ගැසට් පත්‍රයේ* (ඇ) උපලේඛනයෙන් හා 2008 ක් වූ පෙබරවාරි මස 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රයේ හා 2264/18 දරන වර්ෂ 2022ක් වූ ජනවාරි මස 27 දිනැති අති *විශේෂ ගැසට් පත්‍රයේ* (ඇ) කොටසේ සඳහන් පරිදි පැවරී ඇති බලය අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හා කර්මාන්ත සඳහා එකවර වසර 03 ක කාල පරිච්ඡේදයක් සඳහා රු. 4,500.00 ක් වූ පරිසර බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය. .

එසේ ම පරිසර බලපත්‍ර සඳහා වන පරීක්ෂණ ගාස්තු පහත පරිදි ගෙවිය යුතුය.:-

| *මූලික ආයෝජනය* | *පරීක්ෂණ ගාස්තු රු. ශත* |
|---|---|
| රු. 250,000.00 දක්වා | 3,000.00 |
| රු. 250,001.00 - රු. 500,000.00 දක්වා | 3,750.00 |
| රු. 500,001.00 - රු. 1,000,000.00 දක්වා | 5,000.00 |
| රු. 1,000,000.00 ට වැඩි | 10,000.00 |
| අයදුම්පත් ගාස්තු : | 200.00 |

10-214/12

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

මීගහකිවුල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම සම්බන්ධයෙන් පහත යෝජනාවේ දැක්වෙන පරිදි 2026 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට, මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 153 (1) වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක-

(1) එම ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති නම්; හෝ

(2) එම ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක; හෝ

(3) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති ප්‍රමාණය 1/20ට වඩා අඩුවන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීම සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2026 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 0.1% ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2026 අප්‍රේල් මස 30 දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

10-214/13

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා යන්ත්‍රෝපකරණ කුළියට දීමේ ගාස්තු අය කිරීම

මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍රෝපකරණ කුළියට දීම සම්බන්ධයෙන් පහත උපලේඛනයේ දැක්වෙන පරිදි 2026 වර්ෂය සඳහා ගාස්තු අයකිරීමට, මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

2026 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පහත උපලේඛනයේ සඳහන් වාහන යන්ත්‍රෝපකරණ සේවාවන් සැපයීම සම්බන්ධයෙන් ඊට අනුරූපිත තීරුවේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

**වාහන කුලිය සඳහා ගාස්තු**

| *අනු. අංකය* | *වාහනය/යන්ත්‍රය* | *මිළ (දිනකට/පැයකට/දින 1/2) රුපියල්* | | *රැඳවුම් ගාස්තුව රුපියල්* |
|---|---|---|---|---|
| 01. | බැකෝ ලෝඩරය | ඉන්ධන සහිතව පැයකට | 5,700 0 | දිනකට 5,800 0 |
| | | ඉන්ධන රහිතව පැයකට | 3,800 0 | |
| 02. | ටොන් 08 ගල් රෝල | ඉන්ධන සහිතව පැයකට | 5,000 0 | දිනකට 5,100 0 |
| | | ඉන්ධන රහිතව පැයකට | 2,500 0 | |
| 03. | ටොන් 02 ගල් රෝල | ඉන්ධන සහිතව පැයකට | 2,900 0 | දිනකට 3,000 0 |
| | | ඉන්ධන රහිතව පැයකට | 1,500 0 | |
| 04. | ට්‍රැක්ටරය රථය (ට්‍රේලරය සහිතව) | ඉන්ධන සහිතව දිනකට | 11,550 0 | දිනකට 2,500 0 |
| | | ඉන්ධන රහිතව දිනකට | 4,800 0 | |
| | ට්‍රැක්ටරය රථය දින 1/2 සඳහා (පැය 04ක්) | ඉන්ධන සහිතව | 5,750 0 | |
| | | ඉන්ධන රහිතව | 2,400 0 | |
| | ට්‍රැක්ටරය රථය මීටර් පැය 01 ක් සඳහා | ඉන්ධන සහිතව | 1,500 0 | |
| | ට්‍රැක්ටරය රථය (බවුසරය සහිතව, මෝටරය සහිතව) | ඉන්ධන සහිතව දිනකට | 12,550 0 | |
| | | ඉන්ධන රහිතව දිනකට | 5,300 0 | |
| | ට්‍රැක්ටරය රථය (බවුසරය සහිතව, මෝටරය රහිතව) | ඉන්ධන සහිතව දිනකට | 11,550 0 | |
| | | ඉන්ධන රහිතව දිනකට | 4,800 0 | |
| | | ඉන්ධන රහිතව දිනකට | 5,300 0 | |
| | ජල බවුසරය, ට්‍රැක්ටරය සහිතව | ජලය රහිතව කි. මී. 5 ඇතුළත එක් වරකට | 1,300 0 | 1,000 0 (ට්‍රැක්ටරය රහිතව) |
| | | ජලය සහිතව කි. මී. 5 ඇතුළත එක් වරකට | 4,300 0 | |
| | | වැඩිවන අමතර කි. මී. 1 ක් සඳහා | 200 0 | |
| 05. | ජල බවුසරය (ට්‍රැක්ටරය රහිතව) ට්‍රේලරය (ට්‍රැක්ටරය රහිතව) | ඉන්ධන රහිතව දිනකට (ව්‍යාපෘති සඳහා) | 1,250 0 | 1,000 0 (ට්‍රැක්ටරය රහිතව) |

| *අනු. අංකය* | *වාහනය/යන්ත්‍රය* | *මිළ (දිනකට/පැයකට/දින 1/2) රුපියල්* | | *රැඳවුම් ගාස්තුව රුපියල්* |
|---|---|---|---|---|
| 06. | ටිපර් රථය | ඉන්ධන සහිතව දිනකට | 23,000 0 | |
| | | උපරිම කි. මී. 70 වැඩිවන අමතර කි. මී. 1 ක් සඳහා | 270 0 | |
| | | ඉන්ධන රහිතව දිනකට | 10,000 0 | |
| | | උපරිම කි. මී. 70 වැඩිවන අමතර කි. මී. 1 ක් සඳහා | 55 0 | |
| 07 | පස්තලන යන්ත්‍රය | ඉන්ධන රහිතව දිනකට (යන්ත්‍ර ක්‍රියාකරු සමග) | 5,000 0 | |
| | | ඉන්ධන රහිතව දින 1/2 ක් සඳහා (පැය 04 ක්) යන්ත්‍ර ක්‍රියාකරු සමග | 2,500 0 | |
| 08 | කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය | ඉන්ධන රහිතව දිනකට (යන්ත්‍ර ක්‍රියාකරු සමග) | 6,500 0 | |
| | | ඉන්ධන රහිතව දිනකට (යන්ත්‍ර ක්‍රියාකරු නොමැතිව) | 4,500 0 | |

(ඉන්ධන මිල විචලනයක් සිදු වුවහොත් ඉහත ගාස්තු සංශෝධනය කිරීම සභාව සතු වේ.)

කුලී පදනම මත ලබාගන්නා වාහන හා යන්ත්‍රෝපකරණ දින 02 ට වඩා වැඩි කාලයක් භාවිතයට නොගන්නා අවස්ථා වලදී සාධාරණ හේතුවක් නොමැති නම් තුන්වන දින සිට රැඳවුම් මුදල අයකරනු ලැබේ.

10-214/14

---

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

### 2026 වර්ෂය සඳහා සහතිකපත් හා වෙනත් සේවා ගාස්තු අය කිරීම

මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් මහ ජනතාව වෙත සපයනු ලබන සේවාවන් වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2026.01.01 වැනි දින සිට අයකරනු ලබන බව මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 12 වන දින පවත්වන ලද සභා රැස්වීමේ දී යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. කුමාරතිස්ස,
සභාපති,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

මීගහකිවුල ප්‍රාදේශීය සභාව මගින් සිදුකරනු ලබන සේවාවන්හි දී 2026 වර්ෂයේ දී නිකුත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර, සහතික, දැන්වීම් හා අවසර පත්‍ර සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පහත සඳහන් ආකාරයට අය විය යුතු බව මීගහකිවුල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

| *වර්ගය* | | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| **පුස්තකාල :** | | |
| 01 | පුස්තකාල සාමාජික ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 50 0 |
| 02 | පුස්තකාල සාමාජික ගාස්තුව (නව අයදුම්කරුවකු සඳහා) | |
| | * අවුරුදු 6 සිට 12 දක්වා ළමුන් සඳහා | 100 0 |
| | * අවුරුදු 12 සිට වැඩිහිටි ළමුන් සඳහා | 200 0 |
| | * වැඩිහිටි අංශයේ සාමාජික මුදල (බල සීමාව තුළ පදිංචි) | 250 0 |
| | * වැඩිහිටි අංශයේ සාමාජික මුදල (බල සීමාවෙන් පිටත පදිංචි) | 300 0 |
| 03 | පුස්තකාල දඩ (දිනකට) | 5 0 |
| 04 | **පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම (වාර්ෂික)** | |
| | * පාසල් සිසුන් | 100 0 |
| | * වැඩිහිටියන් | 150 0 |
| **පෙර පාසල් :** | | |
| 01. | පෙර පාසල සඳහා ඇතුළත් වීමේ අයදුම්පත් ගාස්තු | 100 0 |
| 02. | පෙර පාසල සඳහා ළමුන් ඇතුළත් වීමේ අයදුම්පත් ගාස්තු | 2,000 0 |
| **වෙනත් :** | | |
| 01. | අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පොදු රැස්වීමක් සඳහා නගර සීමාව භාවිතා කිරීම | 3,000 0 |
| 02. | අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, පොදු රැස්වීම් හා වෙනත් සඳහා මීගහකිවුල සතිපොළ ගොඩනැගිල්ලේ | |
| | උඩු මහල සඳහා | 4,000 0 |
| | බිම් මහල සඳහා | 3,500 0 |
| 03. | කරමැටිය පොළ භූමිය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පොදු රැස්වීමක් සඳහා ඉඩම වෙන් කර ගැනීම සඳහා | 4,000 0 |
| 04. | තල්දෙන පොළ භූමිය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පොදු රැස්වීමක් සඳහා ඉඩම වෙන්කර ගැනීම සඳහා | 4,000 0 |
| 05. | නව බස් නැවතුම්පල භූමිය කුළියට දීම | සභාව සතු භූමියක වර්ග අඩියක්සඳහා එක් දිනකට රු. 5/- |

| වර්ගය | | ගාස්තුව රු. ශත |
|---|---|---|
| 06. | රථ වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම : | |
| | * ත්‍රිරෝද රථ සඳහා | 40 0 |
| | * වෑන් රථ/කාර් රථ සඳහා | 50 0 |
| | * බස් රථ/ලොරි රථ සඳහා | 100 0 |
| | * වෙනත් | 60 0 |
| 07. | පිටමාරුව පුංචි ලෝකාන්තය නැරඹීම සඳහා | |
| | ප්‍රවේශපත්‍ර ලබා ගැනීම : | |
| | *සියළුම සංචාරකයින් සඳහා | 50 0 |
| | *කූඩාරම, ලන්තෑරුම හා BBQ Machine එක (එක් රාත්‍රියක් සඳහා) : | |
| | *පුද්ගලයින් 04ක් සඳහා කූඩාරම (Double Layer auto) | 750 0 |
| | *පුද්ගලයින් 06ක් සඳහා කූඩාරම (Double Layer auto) | 1,000 0 |
| | *පුද්ගලයින් 04ක් සඳහා කූඩාරම, ලන්තෑරුම (භූමිතෙල් රහිතව) | 1,100 0 |
| | සමඟ BBQ Machine (ලොකු) | |
| | *පුද්ගලයින් 06ක් සඳහා කූඩාරම, ලන්තෑරුම (භූමිතෙල් රහිතව)<br>සමඟ BBQ Machine (ලොකු) | 1,300 0 |
| | BBQ Machine (ලොකු) | 300 0 |
| | * ප්‍රමාද ගාස්තු දිනකට රු. 100.00 | |

**නිෂ්පාදනය හා ප්‍රවාහනය මත ගාස්තු අය කිරීම**

| | | |
|---|---|---|
| 01. | කළුගල් හා හුණුගල් කැඩීම වෙනුවෙන් සෑම කියුබ් 01 ක් සඳහාම | 100 0 |
| 02. | තිරුවානා ගල් කැඩීම වෙනුවෙන් සෑම කියුබ් 01 ක් සඳහාම | 150 0 |
| 03. | කුඩා විදුලි බලාගාරවල නිෂ්පාදනය කරනු ලබන විදුලි ඒකක 01 ක් සඳහා (ප්‍රධාන විදුලි පද්ධතියට එක් කරන) | 0 25 |
| 04. | මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැලි වලකින් ගොඩ දමන වැලි කියුබ් 01 ක් සඳහා | 40 0 |
| 05. | වැලි වලේ සිට ප්‍රවාහනය කරන වැලි කියුබ් 01 ක් සඳහා | 60 0 |

10-214/15

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.